# ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රියාවලිය හා ජාතික ලැයිස්තු ක්‍රමය

කේ.එච්.පී.නිශාන්ති[10]


## සංක්ෂිප්තය

දකුණු ආසියවේ දේශපාලනයේ පමණක් නොව මුළු ලොව පුරාම ඡන්දය සඳහා ඇත්තේ ඉතා වැදගත් ස්ථානයකි. එහෙත් ඡන්දය යන මූලිකාංගය මැතිවරණ ක්‍රමයෙන් ජනතාව අතරට පැමිණේ. එහිදි සරල බහුතර ක්‍රමය මෙන්ම සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ මැතිවරණ පවත්වනු ලබයි. කෙසේවෙතත් ශ්‍රී ලංකාවේ සමානුපාතික ක්‍රමය යටතේ හඳුන්වා දෙනු ලැබූ ජාතික ලැයිස්තු ක්‍රමයේ, අරමුණ වන වන්නේ උගත් එහෙත් තරඟකාරී මැතිවරණ ක්‍රියාවලියට එළැඹීමට අකමැති ලාංකිකයන් දේශපාලනයට සහභාගි කර ගැනීමයි. මෙම ලිපියේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ වත්මන් මැතිවරණ ක්‍රියාවලිය තුළ කෙතරම් දුරට එම අරමුණු සාධනය කර ඇත්'ද යන්න පිරික්සීමයි. මෙහිදි ප්‍රධාන වශයෙන්ම, ද්විතීයික දත්ත භාවිතා කරන්නට වු අතර, අධ්‍යයන ක්‍රමවේදය ලෙස විස්තරාත්මක ක්‍රමවේදය භාවිතා කරන ලදි. මෙහි නිගමනය ලෙස ඉදිරිපත් කළ හැක්කේ, වර්තමාන තත්ත්වය තුළ ජාතික ලැයිස්තු ක්‍රමය එතරම් දුරට සිය අරමුණු සාක්ෂාත් කිරීමට සමත් වී නොමැති බවයි.


**මූඛ්‍ය පද:** *ඡන්දය, ජාතික ලැයිස්තු ක්‍රමය, මැතිවරණය, දේශපාලනය*

## හැඳින්වීම

1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව මගින් මෙරටට හඳුන්වා දෙන ලද සමානුපාතික නියෝජන ක්‍රමයේ ප්‍රධාන අංගයක් ලෙස ජාතික ලැයිස්තු ක්‍රමය 14වන ව්‍යවස්ථා සංශෝධනය මඟින් 1988 මැයි 24 හඳුන්වා දෙන ලදි. මෙහිදී පාර්ලිමේන්තුවට වරම් ලබන සාමාජිකයන් 225 දෙනාගෙන් 196 මහජන නියෝජනය යටතේ ද ඉතිරි 29 දෙනා ජාතික ලැයිස්තුව හරහා පාර්ලිමේන්තුවට පත් වේ. මෙම ක්‍රමය ප්‍රථම වරට 1989 දී භාවිතයට ගන්නා ලදි. ලැයිස්තු ක්‍රමය හරහා සමාජයට ඉටුවන්නට ඇති ප්‍රධාන කාරණාවන් ඉටුවනවා ද යන්න විමර්ශනය කරනු ලබයි. වර්තමානයේ මෙම ක්‍රමය පරාජිතයන්ගේ රජ දහනක් වී ඇත. මන් ද, වර්තමානය වන විට උගත් බුද්ධිමත් පිරිස් පමණක්ම ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට පත් වනවා ද යන්න මෙහිදී අපට ඇතිවන ගැටළුවකි. බොහෝ විට වර්තමානයේ සිදු වන්නේ දූෂිතයින් ජනතාව විසින් පාලනයෙන් නෙරපා හරින විට ජාතික ලැයිස්තුවෙන් යළි පාලනය සඳහා බඳවා ගැනීමකි. එහිදී ජාතික ලැයිස්තු ක්‍රමය යනු පරාජිතයන්ට රජ සැප දෙන නිවහනේ මාර්ගය වැනිය. කෙසේ වුව ද ,මෙම ක්‍රමය මගින් යහපත් මෙන්ම අයහපත් ලක්ෂණ ද, දැක ගත හැකිය.

## ජාතික ලැයිස්තු ක්‍රමයේ අරමුණ හා වැදගත්කම

1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව 1988 මැයි 24 හඳුන්වා දෙන ලද ජාතික ලැයිස්තු ක්‍රමයේ ප්‍රධාන අරමුණ වන්නෙ' උගත් බුද්ධිමත් පුද්ගලයන්ගේ සහය පාර්ලිමේන්තුව සඳහා ලබාගෙන විධිමත්, අර්ථවත්, වැඩදායි ව්‍යවස්ථාදායකයක් නිර්මාණය කර ගැනීමයි. එහිදී රටේ සිටින උගත් මහාචාර්යවරු, ආචාර්යවරු, වෛද්‍යවරු ආදී බොහෝ විද්වත්තයින් මේ සඳහා යොදවා ගැනීම තුළින් ඔවුන්ගේ අදහස් අනුගමනය කරමින් සාරවත් සෞභාග්‍ය රටක් බිහි කිරීම ප්‍රධාන අරමුණයි. මෙසේ වන ජාතික ලැයිස්තු ක්‍රමය මඟින් ලැබෙන වාසි කිහිපයකි.

[10] ශාස්ත්‍රවේදී දේශපාලන විද්‍යා (විශේෂ) ප්‍රථම වසර

I. උගත් බුද්ධිමත් පුද්ගලයන්ගේ සහභාගීත්වය හිමි වීම.
II. ඔවුන් තුළ ඇති බුද්ධිමත්භාවය හා කාර්යශූර්යත්වය තුළින් යහපත් රටක් ගොඩ නැඟීමට හැකි වීම.
III. කාර්යක්ෂම හා විධිමත් පාර්ලිමේන්තුවක් බිහිවීම.
IV. සුළු ජාතීන්ට ද, නියෝජනයක් හිමිවීම.
V. පාර්ලිමේන්තුවේ දෙවන මණ්ඩලයක් ලෙස ක්‍රියා කිරීම
VI. ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂාවීම ආදිය පෙන්වා දිය හැකිය.

ප්ලේටෝ පවසනුයේ, යහපත් සමාජයක් ඇති කිරීම සඳහා බුද්ධිමත් පිරිසක් අවශ්‍ය බවයි. ඒ සඳහා ඔහු අධ්‍යාපනය හඳුන්වා දෙන ලදි. එමගින්ද පෙන්වා දෙනු ලබන්නේ යහපත් පාලනයක් උදෙසා බුද්ධිමත් පිරිසකගේ අවශ්‍යතාවයයි. යහපත් ඉදිරි දැක්මක් ඔවුන් සතුවේ. එනිසා වඩා නිවරදි තීරණ ගැනීමේ හැකියාවක් පවතී. එනිසාම රාජ්‍ය යහපත් වනවා මෙන්ම රාජ්‍ය පහසුවෙන් පාලනය කළ හැකිවේ. එසේම බුද්ධිමත් පිරිසකගෙන් සමන්විතවීම තුළ පාර්ලිමේන්තුවේ ඵලදායී ක්‍රියාමාර්ග ගත හැකිවීම නිසා ගැටළු ඇතිවීම වළක්වා ගත හැකිය. එසේම සිංහල ප්‍රජාව මෙන්ම බෙහෝ සුළු ප්‍රජාවන් ජීවත්වන ශ්‍රී ලංකාව තුළ සුළු ප්‍රජාව හට මැතිවරණයකින් පාර්ලිමේන්තුව සඳහා පැමිණීම පහසු කාර්යයක් නොවේ. එනිසා ජාතික ලැයිස්තුව මඟින් නියෝජිතයන් පාර්ලිමේන්තුවට පත් කර ගැනීම නිසා මැතිවරණයෙන් පැමිණීමට නොහැකි වුව ද, සුළු පක්ෂවල මෙන් ම සුළු ජාතීන්ගේ ද, අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීමට හැකිවීම මෙහි විශේෂ වාසියකි. අප රට තුළ වත්මන් පාර්මේන්තුව ඒක මාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් ලෙස ක්‍රියාත්මක වේ. එහෙත් මතුපිටින් ඒක මාණ්ඩලික ස්වරූපයක් ගත්ත ද, එහි සාමාජිකයන් 225 දෙනාගෙන් 196 මනාප ඡන්ද ක්‍රමයෙන් ද, අනෙක් 29 දෙනා ජාතික ලැයිස්තුවෙන් ද, පත්වේ. මෙහිදි ජාතික ලැයිස්තුවෙන් පත්වන 29 දෙනා දෙවන මණ්ඩලයක් ලෙස ප්‍රායෝගිකව ක්‍රියාත්මකවීම පාර්ලිමේන්තුවේ තීන්දු තීරණ ශක්තිමත් වීමට උපකාරීවේ. එසේම ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂාවීම ද, සිදුවේ.

## ජාතික ලැයිස්තු සාමාජිකයන් තෝරා පත් කර ගැනීම

සාමාජිකයන් තෝරා පත් කර ගැනීමේදී ඡන්ද දායකයන් ඡන්දය ප්‍රකාශ කරනුයේ පක්ෂය සඳහාය. එහිදී ඡන්දදායකයාට එක් ඡන්දයක් පමණක් හිමි වේ. මෙහිදී පක්ෂය විසින් මැතිවරණය සඳහා අපේක්ෂක ලැයිස්තුවක් ඉදිරිපත් කළ යුතු අතර එයට අතිරේක නම් 03ක් ද, ඇතුළත් කළ යුතුය. මෙහිදි පක්ෂයට ලැබුණු මුළු ඡන්ද සංඛ්‍යාව මන්ත්‍රීවරයෙකු වශයෙන් තේරී පත්වීමට අවශ්‍ය ඡන්ද සංඛ්‍යාවෙන් බෙදීමෙන් එම පක්ෂයට හිමි ආසන සංඛ්‍යාව තීරණය වේ. මහ මැතිවරණයේදී ඒ ඒ පක්ෂ මුළු දිවයිනේම ලබා ගන්නා ඡන්ද අනුපාතයට අනුව බෙදා දෙනු ලබන හිමිකම් ප්‍රමාණයක් ඇත. මෙම වලංගු ඡන්ද සංඛ්‍යාව 29න් බෙදා නියෝජනයට හිමි ඡන්ද සංඛ්‍යාව සොයා ගනී. පසුව පක්ෂය ලබාගෙන ඇති මුළු ඡන්ද සංඛ්‍යාව වෙන වෙනම ගෙන ජාතික ඡන්ද අනුපාතයෙන් බෙදීම යටතේ නියෝජන 29 බෙදී යන ආකාරය තීරණය කළ යුතුවේ. පසුව මැතිවරණ කොමසාරිස් දේශපාලන පක්ෂයක නම් එහි ලේඛම්වරයාට ද, ස්වාධීන කණ්ඩායමක නම් එහි නායකයාට ද, සුදුස්සන් නම්කර යැවීමෙන් ජාතික ලැයිස්තුවේ 29 දෙනා පත්වීම සම්පූර්ණ වේ (මුදලිගේ, 2015: 254 ).

මෙහිදී නියෝජන හිමිකම් තිරණය කිරීම විවිධ ස්වරූප ගනී. එසේම මෙම ලැයිස්තු ක්‍රමයේදී ලැබී ඇති ඡන්දවලින් කොපමණ ප්‍රමාණයකට එක් නියෝජනයක් ලැබෙනවා ද, යන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ මැතිවරණ නීති මඟින් නිශ්චිතව දක්වා ඇත. ඒ සඳහා ක්‍රම දෙකක් ඉදිරිපත්ව ඇත. එනම්, ඩ්රූප් ක්‍රමය හා හෙයාර් ක්‍රමයයි. හෙයාර් ක්‍රමය සිදු වන්නේ පහත පරිදිය.

$$\frac{\text{පාවිච්චි තළ මුළු ඡන්ද සංඛ්‍යාව}}{\text{පත් කළ මන්ත්‍රී සංඛ්‍යාව}} = \text{ඡන්ද පංගුව}$$

(අමරසිංහ, 2001:40)

උක්ත ලෙස නියෝජනයට අවශ්‍ය සාමාන්‍ය ඡන්ද සංඛ්‍යාව ගණනය කිරීම සිදු වේ. එසේම ඡන්ද ප්‍රමාණයන් අනුපාතයක් වශයෙන් පෙළගස්වා එම අනුපාතයට අනුව නියෝජන හිමිකම් තීරණය කිරීමට පුළුවන.

මෙසේ පත්වන මන්ත්‍රී ධූර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 (13) (අ) වගන්තිය ප්‍රකාරව ඔහු පක්ෂයෙන් හෝ ස්වීධීන කණ්ඩායමෙන් ඉල්ලා අස්වීම හෝ පහ කිරීමෙන් ධූරය අහෝසි වුවහොත් මාසයක් ඉකුත් වූ විට එම අසුන හිස් වේ (අමරසිංහ, විල්බට්,2001: 63). මෙහි පුරප්පාඩු ඇති වුවහොත් අතුරු මැතිවරණයක් පැවැත්විය යුතු වුව ද, 1978 ව්‍යවස්ථාවට අනුව මැතිවරණ කොට්ඨාසයේ අදාළ දේශපාලන පක්ෂයේ හෝ ස්වාධින කණ්ඩායමේ නාම යෝජනා ලැයිස්තුවෙන් මනාප වැඩිම පද්ගලයා තෝරා ප්‍රකාශයට පත් කළ පසු පක්ෂයේ නායකයා හෝ ලේඛම්වරයාට දන්වා පුරප්පාඩු පුරවනු ලබයි. පහත දක්වා ඇති වගු අංක 1න් 1989 සිට 2015 දක්වා කාලය තුළ මැතිවරණ කිහිපයකදී ඒ ඒ පක්ෂ තුළින් ජාතික ලැයිස්තුව තුළින් පත් වූ අපේක්ෂකයින් ප්‍රමාණය පහත වගුවෙන් දක්වා ඇත.

වගු අංක 01: 1989 සිට 2015 දක්වා කාලය තුළ මැතිවරණ කිහිපයකදී ඒ ඒ පක්ෂ තුළින් ජාතික ලැයිස්තුව තුළින් පත් වූ අපේක්ෂකයින් ප්‍රමාණය

| **පක්ෂය** | **ආසන** | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | **1989** | **1994** | **2000** | **2001** | **2004** | **2010** | **2015** |
| එක්සත් ජාතික පක්ෂය | 15 | 13 | 12 | 12 | 11 | 09 | 13 |
| ශ්‍රී ලංකා නිදහස් සංධානය | 09 | 14 | 13 | 11 | 13 | 17 | 12 |
| ද්‍රවිඩ පෙරමුණ | 01 | | | 02 | | | |
| එක්සත් සමාජවාදී පෙරමුණ | 01 | | | | | | |
| මහජන එක්සත් පෙරමුණ | | | | | | | |
| මුස්ලිම් කොංග්‍රසය | 01 | 01 | | 01 | 01 | | |
| ජාතික සමගි පෙරමුණ | | | 01 | | | | |
| ජනතා විමුක්ති පෙරමුණ | | | 02 | 03 | | 02 | 02 |
| සිහල උරුමය | | | 01 | | | | |
| දෙමළ සන්ධානය | | | | | 02 | | 02 |
| හෙළ උරුමය | | | | | 02 | | |
| දෙමළ එක්සත් ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ | | 01 | | | | | |
| ශ්‍රී ලංකා ප්‍රගතිශීලී පෙරමුණ | | | | | | | |
| ස්වාධීන කණ්ඩායම් | | | | | | | |
| වෙනත් | 01 | | | | | 01 | |

Source: www.ipu.org, www.infolanka.com

## ජාතික ලැයිස්තු ක්‍රමයේ අරමුණු සාධනය

රාජ්‍යයක උත්තරීතරම ආයතනය ලෙස සළකනු ලබන්නේ පාර්ලිමේන්තුවයි. ආණ්ඩුක්‍රමයක් පවතින ඕනෑම රාජ්‍යයක රටේ පාලනය හිමි වන්නේ පුද්ගලයෙකුට හෝ පුද්ගල කණ්ඩායමකටය. මෙහිදී පාර්ලිමේනතුව තුළ අසුන් ගන්නා මන්ත්‍රිවරුන්ට අනෙක් පුරවැසියන්ට වඩා සුවිශේෂී කාර්යයන් පැවරේ. අතීතයේ දේශපාලන දාර්ශනිකයින් පවා පාලකයන්ගේ කාර්ය භාර්ය ගැන අදහස් දක්වා ඇත්තේ මේ නිසා විය හැකිය. ප්ලේටෝ රිපබ්ලික් කෘතියේ සඳහන් කර ඇත්තේ රාජ්‍යතන්ත්‍රවාදය ඉතා උත්තරීතර බැවින් රාජ්‍ය තාන්ත්‍රිකයා තම රාජ්‍යයෙහි යහපත් බව දැන ගන්නේ වෛද්‍යවරයෙකු සෞඛ්‍ය පිළිබඳ යහපත් බව දැනුවත් වනවා සේය යන්නෙනි (ගොඩගම, 2014: 14).

පාර්ලිමේන්තුව නියෝජන ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයේ ප්‍රධාන ආයතනයයි. නීති සම්පාදනය නම් රටේ උත්තරීතරම කාර්යය හිමි වන්නේ ද පාර්ලිමේන්තුවටයි. පිලිප් මැස්ඩන් සඳහන් කරනුයේ; පාර්ලිමේන්තුව යනු අධිකරණයක ස්වරූපයෙන් මෙන්ම ව්‍යවස්ථාදායක සභාවක් ලෙසත් මහජනයාගේ නිදහස ආරක්ෂා කිරීමටත් සම්පාදනය වු ආයතනයක් බවයි. එනම් පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයේ ක්‍රියාකාරිත්වය රඳා පවතිනුයේ එහි සිටින සාමාජිකයන් හෙවත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් මතය. පාර්ලිමේන්තුව යනු මහ ජනතාව විසින් පත් කරනු ලබන මන්ත්‍රීවරුන්ගෙන් සැදුම්ලත් ජනතාවගේ ස්වාධිපත්‍ය ක්‍රියාත්මක කරනු ලබන ආයතනයයි. ජීන් ජැක් විස් රූසෝ දක්වන පරිදි ස්වාධිපත්‍ය යනු, ජනතාව සතු දෙයකි. එනම් පුරවැසියාට ඉහළින් පවතින කිසිඳු නීතියක් මගින් සීමා නොවෙන උත්තරිතර බලයකි. ආණ්ඩුවක් පවතින ජනතාවගේ ස්වාධිපති බලය පාර්ලිමේන්තුවට ලබා දී ඇත. මෙහිදී පෙන්වා දෙන පරිදි රාජ්‍ය පාලන කටයුතු සඳහා ඇති පාලන ආයතනය වන පාර්ලිමේන්තුව සඳහා ඇත්තේ ජනතා පරමාධිපත්‍ය වේ. ඔවුන් තෝරා ගනු ලබන්නේ ජනතාව විසිනි. මීට අමතරව ජාතික ලැයිස්තු ක්‍රමය මඟින් ද, නියෝජිතයන් තෝරා පත් කර ගනු ලබයි. මෙහිදී පත් වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ භූමිකාව ඉතා පුළුල් පරාසයක් ගනී. මේ තුළ ඔවුන් මන්ත්‍රීවරයෙකු වීමට පෙර සිටම සමාජ සේවකයෙකු මෙන්ම ඒ හා සමාන ගුණාංග ද ඔහු තුළ තිබිය යුතුය. එසේම මේ සඳහා ඉදිරිපත් වන පුද්ගලයන් තුළ ජනතාව තමා වටා ඒකරාශි කර ගැනීම සඳහා කරීකත්වයත්, සමාජ සේවාවත් තිබිය යුතුය. ඔහු ජනතාව අතර ජනප්‍රිය වීමට කටයුතු කළ යුතු සේම තමන් බලයට වූ විට ජනතාව වෙනුවෙන් ඉටු කරනු ලබන දේ පොරොන්දු වශයෙන් ලබා දිය යුතුවේ.

එසේම පාර්ලිමේන්තුවක සිටින මන්ත්‍රීවරයා සමාජයේ අන් සංවිධාන සාමාජිකයන්ගෙන් වෙනස් වේ. ඔහුට"ගරු"යනුවෙන් පදවි නාමයක් ද හිමිවේ. මන්ද ඔවුන්ට තම බලය ලැබී ඇත්තේ මහජන ස්වාධිපත්‍ය නිසාවෙනි. ඡන්දයෙන් පත්වන මන්ත්‍රීවරුන් 196ට අමතරව ලැයිස්තු ක්‍රමය මඟින් ද, 29 දෙනෙකු පත් කර ගනු ලබයි. ඒ උගත් බුද්ධිමත් පිරිසකි. ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු ඉතිහාසයේ ද, සර්වජන ඡන්ද බලය හිමි වීමට පෙර ද, ඉංග්‍රීසි උගත් ධනවත් අයට ජාතීන් අනුව නියෝජන අවස්ථා හිමිවිය. එය මේ සඳහා පූර්ව අත්දැකීමක් විය හැකිය. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය තුළ ඍජු ප්‍රජාතන්ත්‍රවාදය මෙන් සියළු දෙනාට පාලනයට සම්බන්ධ වීමට නොලැබෙන අතර ජනතා වීසින් තෝරා ගන්නා ලද නියෝජිතයෙකු මාර්ගයෙන් රට පාලනය කරනු ලැබේ (ගොඩගම, 2014: 41). අනෙක් අතට මොවුන් නිශ්චිත කාලයකට පත් වේ. මේ නිසා ඔවුන් වගකීම් නොපිරිහෙලා ඉටු කළ යුතු වේ. මන්ද එසේ නොවුනහොත් ඊළඟ මහ මැතිවරණයේදී ඔවුන් පාර්ලිමේන්තු මන්ත්‍රිවරයෙකු බවට පත් කිරීමට ජනතාවට හැකියාව පවතී. නමුත් වර්තමාන ශ්‍රී ලංකාව තුළ ලැයිස්තු ක්‍රමය භාවිතා වන බැවින් බොහෝ විට සිදු වන්නේ උගත් බුද්ධිමතුන් ඒ සඳහා යොදා ගන්නවා වෙනුවට මැතිවරණයෙන් පරාජිතයන් ලැයිස්තු ක්‍රමය මගින් පාර්ලිමේන්තුව සඳහා පත් කර ගැනිමයි. එයින් අපට නිගමනය වන්නේ ජනතාවට එම නියෝජිතයන් පත් කිරීමේ ස්වාධිපත්‍ය හිමි වුව ද, එය නොතකා වෙනත් ක්‍රියාමාර්ග ඔස්සේ ඔවුන් කැමති පුද්ගලයන් ඒ සඳහා පත් කර ගන්නා බවයි. ඔවුන් වගකීම් ඉටු නොකිරීම හේතු කොට ගෙන ජනතාව ඔවුන්ව ප්‍රතික්ෂේප කළ ද යළිත් ඔවුන්ට නවාතැන් සැපයීමක් ලැයිස්තු ක්‍රමය මඟින් ලැබී ඇත.

එසේම සෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුම කුමන හෝ දේශපාලන පක්ෂයක නැතහොත් ස්වාධීන කණ්ඩායමකට අයත් වේ. ලැයිස්තු ක්‍රමයෙන් පත්වන නියෝජිතයන්ට ද පක්ෂයක් පවතී. ඔවුන් එම පක්ෂයේ රැස්වීම් ආදී සියළු දේට සහභාගි විය යුතු සේම ඔවුගේ අරමුණු ද, පක්ෂයේ අරමුණු විය යුතුය. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ මූලිකම කාර්යය වන්නේ තමන්ගේ ඡන්ද කොට්ඨාසයේ සේවය කිරීම බව පර්යේෂණ මගින් හඳුනාගෙන ඇත. මෙහිදී බොහෝ මන්ත්‍රීවරුන් ප්‍රාදේශීය කාර්යාලයක් පවත්වා ගැනීම මඟින් ජනතාව සමඟ සබඳතා පවත්වා ගනිති. මෙම කටයුතු ඔවුන් ඊළඟ මැතිවරණයේදී පාර්ලිමේන්තුවට පත් කිරීමට හෝ නොකිරීමට බලපානු ඇත. නමුත් බොහෝ විට ඔවුන් එම වගකීම් ඉටු කිරීමට උත්සහ නොකරනුයේ ලැයිස්තු ක්‍රමය මඟින් නැවත පත් වීමට හැකියාවක් ඇති හෙයිණි. එසේම ජනතාව විසින් පත් කරන නියෝජිතයන් වුව ද, අදූරදර්ශී විය හැකිය. මන්ද ජනතාව බුද්ධිමත් නොවීම මෙහිදී බලපානු ඇත. එනිසා ඔවුන් ගන්නා තීරණ පරිස්සමින් ගත යුතුව ඇත. එසේම සෑම රටකම සමාජ සුභසිද්ධිය හා යහපාලනයට අදාළ නීති සම්පාදනය කිරීමේ බලය පාර්ලිමේන්තුව සතුවේ. මන්ද එහි නියෝජිතයන් ජනතාව පත් කරන

බැවිණි. මෙහි අවසාන අර්ථය නම්"රටක නීති සම්පාදනය කරනු ලබන්නේ මහ ජනතාව විසිනි" යන්නයි (ගොඩගම, 2014: 51).

එසේම රාජ්‍ය මූල්‍ය බලතල ද, පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන්ට හිමි වේ. එහිදී මහජනයාගෙන් එකතු කරන ආදායම් ද, මහජනතාව වෙනුවෙන් කරන වියදම් ද, ඇතුළු සියලු බලතල මහජන නියෝජිතයන් වෙත ජනතාව විසින් ලබා දේ. එහෙත් වර්තමාන ජාතික ලැයිස්තුව සඳහා උගත් බුද්ධිමත් පිරිස් තෝරා පත් කර ගැනීමක් සිදුවනවා නම් එය රටේ සංවර්ධනයට හේතුවේ. එහෙත් ජනතාව විසින් තම ආදායම් පාලනයට නුසුදුස්සන් ලෙස සළකන පිරිස් නැවත රාජ්‍ය පාලනය සඳහා යොදා ගන්නේ මන්ද යන්න අපැහැදිලි කරුණකි. මෙහිදී තනතුරු දරන මෙන්ම තනතුරු නොදරන සෑම මන්ත්‍රීවරයෙකුම මහජනතාව වෙනුවෙන් පෙත්සම් ඉදිරිපත් කිරීම, ප්‍රශ්න ඇසීම, විවාද කිරීම, යෝජනා ඉදිරිපත් කිරීම ආදිය මඟින් පාර්ලිමේන්තුව තුළ ක්‍රියාකාරීව කටයුතු කිරීමට ඔවුන්ට අවස්ථාව සැලසේ. නමුත් බොහෝ මන්ත්‍රීවරු එම වගකීම පැහැර හරිනවා මෙන්ම පාර්ලිමේන්තු සැසිවාර සඳහා ද සහභාගීවීම ද, ඔවුන් පැහැර හරිනු ලබයි. එසේ වගකීමක් නැති ඔවුන් රාජ්‍ය පාලනයෙන් ඉවත් කිරීම ජනතාව සතු කාර්යයක් මෙන්ම ඔවුන් නැවත ලැයිස්තු ක්‍රමය හරහා බඳවා නොගැනීම සියලු දෙනාගේ වගකීමකි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාට පවතින්නේ ජනතා කේන්ද්‍රීය සේවයකි. එනිසා ඔවුන් පාර්ලිමේන්තුවේදී මෙන්ම ඉන් පිටතදී ද, ජනතාව සමඟ වැඩිපුර කාලය ගත කළ යුතුවේ. නමුත් වර්තමාන දේශපාලනයේදී සිදු වන්නේ ඔවුන්ගේ සුභසිද්ධිය උදෙසා කටයුතු කිරීමකි. බලලෝභී මිනිසුන් බිහි වූ විට ඇති වන්නේ ආත්මාර්ථකාමීත්වයයි. එය වර්තමාන දේශපාලනය අධ්‍යනයේදී ඉස්මතුවන කරුණකි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වීමට බොහෝ දෙනා කැමැත්තක් දක්වති. ඒ බොහෝ විට තමන්ගේ වාසිය සඳහාය.

කෙසේවෙතත්, 1978වන ව්‍යවස්ථාව මගින් හඳුන්වා දුන් සමානුපාතික නියෝජන ක්‍රමයේ එන ජාතික ලැයිස්තු ක්‍රමයේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ, උගත් බුද්ධිමත් පිරිසකගේ සහය රටේ සංවර්ධනය උදෙසා යොදා ගැනීම වුව ද, 1989 සිට අද දක්වා මැතිවරණ දෙස බලන විට උගත් බුද්ධිමතුන් බඳවා ගන්නවා යන වෙස් මුහුණට සැඟවී මැතිවරණයෙන් පරාජිත අපේක්ෂකයන්ගේ අපේක්ෂාවන් ඉටු කරන රඟහලක් බවට ජාතික ලැයිස්තු ක්‍රමය පත්වී ඇත. මෙය උදාහරණ රැසකින් පහතින් ඔප්පු කර ඇත. ශ්‍රී සමානුපාතික ක්‍රමය යටතේ ජාතික ලැයිස්තුවෙන් මන්ත්‍රීවරු පත් කරගත් පළමු මැතිවරණයයි. එනම් 1989 මැතිවරණයයි. එය තුළින් ද, උක්ත තර්කය සනාථ කළ හැකිය. 1989 මැතිවරණයේදී හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් තරඟ වැද පරාජයට පත් මර්වින් සිල්වා ජාතික ලැයිස්තුවට බඳවා ගන්නා ලදි. තවද, 2000 මැතිවරණයේදී ජනතා විමුක්ති පෙරමුණේ ජාතික ලැයිස්තු ආසන 02න් 01ක් ගම්පහ දිස්ත්‍රික්කයෙන් තරඟ වැද පරාජයට පත් අන්ජාන් උම්මාටය හිමි විය. එසේම, 2004 මැතිවරණයේදී මැද කොළඹින් තරඟ වැද පරාජයට පත් මර්වින් සිල්වා ජාතික ලැයිස්තුවට බඳවා ගැනීම සඳහා උපක්‍රමශීලීව බිරිඳ මේරි ලූසිල්ඩා ගෙන සතියකින් ඉල්ලා අස්වීම සිදු විය. මේ සඳහා ඉතා හොඳම නිදසුන 2015 මැතිවරණයයි. 2015 මැතිවරණයේදී ජාතික ලැයිස්තුවෙන් පත් කරනු ලැබූ මන්ත්‍රීවරුන් 29 දෙනාගෙන් 11 දෙනෙකු පරාජයට පත් අපේක්ෂකයන් විය. එහිදී එක්සත් ජනතා සන්ධානයෙන් 07ක් ද, දෙමළ සන්ධානයෙන් 02ක් ද, එක්සත් ජාතික පක්ෂය හා ජනතා විමුක්ති පෙරමුණින් 01ක් ද, පරාජයට පත් අපේක්ෂකයන් තෝරා ගෙන ඇත (සමරකෝන්, 2015:මුල් පිටුව). එහිදී ගම්‍ය වන්නේ, උගත් බුද්ධිමත් පිරිසකගේ සහය ලබා ගන්නවා වෙනුවට පරාජයට පත් අපේක්ෂකයන්ගේ අරමුණු මුදුන් පමුණුවන අපූරු නිවහනක් බවයි. මෙසේ පත්වන මන්ත්‍රීවරුන් අධික බල කාමයෙන් පසුවන්නෝ වෙති. මන්ද ජනතාව ප්‍රතික්ෂේප කළ පසු ද, එයම නවාතැනක් කරගනු ලබන්නේ තම ආරක්ෂාව මෙන්ම පැවැත්ම ද එතුළින් තහවුරු වන නිසාවෙණි. එය වත්මනයේ ඇති වී තිබෙන භයානක ඛේදවාචකයකි.

පොදු ජනතා මතයට ගරු නොකිරීම ද, මෙහි දුර්වලතාවයකි. මැතිවරණයේ දී අපේක්ෂකයන් පරාජයට පත් කරනුයේ ඔහුගෙන් රටට සේවාවක් නොවන නිසාවෙණි. එහෙත් වත්මන් ලැයිස්තු ක්‍රමය අධ්‍යනයේදී බොහෝ විට දැකිය හැකි වන්නේ පරාජයට පත් අපේක්ෂකයන් වේ. නුසුදුස්සන් ලෙස නෙරපා හරින පුද්ගලයන් නැවත පත් කිරීම ජනතා මතය පැහැර හැරීමකි. ජනතා ඡන්දයෙන් පත් නොවන මොවුන් ජනතාවගේ අපේක්ෂාවන්, අභිලාෂ ඉටු කිරීමට බැඳී ඉන්නවා ද, යන්න

ප්‍රහේළිකාවකි. වත්මන්යේ උගත් බුද්ධිමත් පිරිස ජාතික ලැයිස්තුවෙන් ඉවතටයාම තුළ ජනතා ඡන්දයෙන් පරාජයට පත් පිරිස එහි අරක්ගෙන ඇත. ධනයට අශා කරන ඔවුන් ජනතා අවශ්‍යතාවන් වෙනුවෙන් කටයුතු නොකරති. මිනී මැරීම්, වංචා දූෂණ බොහෝ සිදු වන්නේ ධනපති පංතිය තුළිනි. ධනය, බලය, ලිංගිකත්වය යන කරුණු තුළින් උපත ලබන පුද්ගලයාට වඩා වැදගත් වන්නේ බලයයි. එසේම සුළු බුද්ධිමත් පිරිසක් පත් වුව ද, ඔවුන්ට ද නිසි තීරණයක් ගත නොහැකිය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ "හිස්බුල්ලා" මහතා ජාතික ලැයිස්තුවට පත් වන්නේ එ.ජ.නි.ස.ලේකම්වරයාව සිටි සුසිල් ප්‍රේම ජයන්ත සමඟ කළ ගිවිසුමකිනි. එහිදී ගිවිසුම් හෝ වෙනත් අයුරින් ජනතාව ප්‍රතික්ෂේප කරන පාලකයන් ගැනීම තුළ රටේ අනිගතයට කුමක් වන්නේ ද යන්න සිතාගත නොහැක. මොවුන් නිසි පරිදි ඉටු කළේ නම් ඔවුන් පරාජය නොවන්නේය. මෙම කරුණුවලින් නිරූපණය වන්නේ, ජාතික ලැයිස්තු ක්‍රමයේ ප්‍රධාන අරමුණ බොහෝ විට අතීතයේදී සාධනය වුව ද වර්තමානය වන විට එය මුළුමනින්ම වෙනස් වී පරාජිතයන්ට කත් අඳින, සෙවන දෙන නිවහනක් බවයි.

## නිගමනය

1978 ව්‍යවස්ථාව මගින් හඳුන්වා දුන් සමානුපාතික නියෝජන ක්‍රමයේ අංගයක් වන ජාතික ලැයිස්තු ක්‍රමයේ යහපත් මෙන් ම අයහපත් ලක්ෂණ ද දැකගත හැකිය. කෙසේ වෙතත් ලැයිස්තු ක්‍රමයේ අරමුණු ආරම්භ කාලයේ යම්තාක් දුරට ඉටු වුව ද වර්තමානයේ එම අරමුණු කොළයකට සීමා වන ප්‍රායෝගිකව ඉටු නොවන ප්‍රතිපත්තියකි. මන්ද ජනතාවගේ අභිලාෂ ඉටු කිරීම වෙනුවට ඔවුන් පාර්ලිමේන්තු සැසිවාර අඛණ්ඩව පැමිණීම, ජනතාව වෙනුවෙන් පාර්ලිමේන්තුව තුළ කතා කිරීම ද, මේ වන විට පැහැරහැර ඇත. මේ තත්ත්වය තුළ තමන්ට පැවරුණු රටේ අනාගතය, සංවර්ධනය, පුරවැසියන්ගේ අභිලාෂ, අභිමතාර්ථ ඉටු කිරීමක් වර්තමානයේ සිදු වන්නේ නැත. අප නිදහස ලබා වසර 68ක් වුව ද, අප සිටිනුයේ ආරම්භයේය. කෙසේවෙතත්, මෙහි නිගමනය කරනුයේ රාජ්‍ය පාලනයට ජාතික ලැයිස්තුවෙන් පාර්ලාමේන්තුවට පත්වන නියෝජිතයන් උගත් බුද්ධිමත් පිරිසක් විය යුතු බවත් මහජන ඡන්දයෙන් පරාජයට පත්වන පුද්ගලයන් නොවිය යුතුය යන්නයි. එසේම මහජන නියෝජිතයන් පත් කළ යුත්තේ මහ ජනතාව විසිනි. මන්ද ඔවුන් ජනතාවට වගකීමට බැඳී සිටින නිසාවෙණි. එසේම දේශපාලන පක්ෂවල අභ්‍යන්තර අර්බුද ඇතිවීමට ද, මෙම ලැයිස්තු ක්‍රමය හේතුවේ. මෙසේ ලැයිස්තු ක්‍රමය මඟින් සාමාජිකයන් බඳවා ගැනීමේදී රටේ සංවර්ධනය උදෙසා කාර්යශූර්ය නියෝජිතයන් ලෙස තරුණ පරපුර ද, ජාතික ලැයිස්තුවට පත් කර ගැනීම තුළින් වඩා යහපත් දේශපාලන ක්‍රමයක් පවත්වා ගැනීමට උපකාරී විය හැකි බව මෙම විමර්ශනය තුළින් හෙළි වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ


අමරසිංහ, විල්බට් ඒ.පී., 2001. *ශ්‍රී ලංකා ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා යටතේ මැතිවරණ ක්‍රම*, කොළඹ :ගොඩගේ සහ සහෝදරයෝ.

අයේෂා, ගොඩගම., 2014. *ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු ක්‍රමය සහ මහජන නියෝජිතයා*, බත්තරමුල්ලඃ සමීර ප්‍රකාශන.

පාරිසරික ජනමාධ්‍යවේදී පර්ෂධය., 2004. *නිදහස් හා සාධාරණ මැතිවරණ වාර්ථාකරණය පිළිබඳ මාධ්‍ය අත් පොත*, ජයවර්ධනපුරඃ පාරිසරික ජනමාධ්‍යවේදී පර්ෂධය

මුදලිගේ, ප්‍රියන්ත., 2015. *ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමය හා දේශපාලනය*, කතඃ ප්‍රකාශනයකි

අලහකෝන්, අජිත්., 2015. *ලැයිස්තුවෙන් මා නම් කළේ සුසිල් සමඟ අත්සන් කළ ගිවිසුමකට අනුවයි*, දිවයින, අගෝස්තු 14, පිටුව 1

පෙරේරා, අකිත., 2015. *එ.ජ.නි.ස,ජාතික ලැයිස්තුවත් කල එළි බසි*, දිවයින, අගෝස්තු 22, පිටුව 1

සමරකෝන්, ප්‍රදීප්., 2015. *එ.ජ.නි.ස,ලැයිස්තු* මන්ත්‍රීවරු 11 පරාජිත අපේක්ෂකයන් නම් කරයි, දිවයින, අගෝස්තු 24, පිටුව 1

සරත්, ධර්මසේන., 2015. *සන්ධානයේ ජාතික ලැයිස්තුවට අදාළ ගැසට් එක අවලංගු කරන්න*, දිවයින අගෝස්තු 27, පිටුව 4

www.ipu.org

www.infolanka.com